රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

அரச கணக்குகள் திணைக்களம்

Department of State Accounts

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு

Ministry of Finance, Planning and Economic Development

කාර්යසාධන වාර්තාව

செயலாற்றுகை அறிக்கை

Performance Report

2025

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය		
1.1	හැඳින්වීම	**1**
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු	**1 – 2**
1.3	ප්‍රධාන කාර්යයන්	**2 – 3**
1.4	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ	**3**
1.5	සංවිධාන ව්‍යුහය	**4**
පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	නව පරිගණකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම්කරණ පද්ධතිය (New CIGAS)	**5 – 6**
2.2	භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය [Integrated Treasury Management Information System (ITMIS)]	**7 – 10**
2.3	මූල්‍ය වාර්තාකරණ සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති	**10 – 12**
2.4	වැටුප් මෘදුකාංග	**13**
2.5	රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණ	**13 – 15**
2.5	මුදල්, තැන්පතු ගිණුම් හා අත්තිකාරම් ගිණුම්	**15 - 18**
පරිච්ඡේදය 03 – 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය		
3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	**19**
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	**20**
3.4	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	**21**
3.5	මූල්‍ය ප්‍රකාශ සටහන්	**22 - 23**
3.6	ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය	**24**
3.7	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය	**24**
3.8	මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	**24**
3.9	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය	**25**
3.10	විගණකාධිපතිවරයාගේ වාර්තාව	**26 - 31**
පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක		
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම පදනම්ව)	**32 - 38**
පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SGD) සපුරා ගැනීමේ කාර්යසාධනය		
5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු	**39**
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	**39**

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	**40**
6.2	ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය	**40 - 41**
6.3	මානව සම්පත් සංවර්ධනය	**41 - 42**

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **43 - 52**

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්ති සම්පාදනයේ දී අවශ්‍ය සහයෝගය දක්වමින් වඩාත් විනිවිදභාවයකින් හා නිරවද්‍යතාවයකින් යුක්තව රාජ්‍ය මූල්‍ය වාර්තාකරණයක් පවත්වා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍යවන්නා වූ මඟ පෙන්වීම හා උපදේශනය ලබා දෙමින් රාජ්‍ය මූල්‍ය වාර්තාකරණයේ ඒකීයභාවය ආරක්ෂා කිරීම මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව, රජයට හා අදාළ පාර්ශ්වයන් වෙත තීරණ ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය තොරතුරු වාර්තා කර ඉදිරිපත් කිරීමේ මධ්‍යගත ආයතනය වශයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ.

1.2 අපගේ දැක්ම,මෙහෙවර හා අරමුණු

දැක්ම

“රාජ්‍ය මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය” බවට පත්වීම.

මෙහෙවර

රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය මූල්‍ය තොරතුරු ලබාදීම සඳහා මධ්‍යගත පරිගණක මූල්‍ය තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම සහ රජයේ වාර්ෂික ඒකාබද්ධ අවසන් ගිණුම් පිළියෙල කර එහි සියලු ම පාර්ශ්වකරුවන්ට දැන ගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම.

අරමුණු

- **ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට ගිණුම්මය සහාය ලබාදීම.**
- **ගිණුම්කරණ තොරතුරු උත්පාදනය කිරීම සඳහා සියලු ම ගිණුම් ඒකකවලින් දත්ත එකතු කිරීම මඟින් ගිණුම්කරණ දත්ත පද්ධතියක් පවත්වා ගැනීම.**
- **ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව රාජ්‍ය ගිණුම් ප්‍රකාශනවල ගුණාත්මකභාවය අඛණ්ඩව වර්ධනය කිරීම.**
- **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා වගවීම හා විනිවිදභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය නිවැරදි ගිණුම්කරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යාම.**
- **විද්‍යුත් ආකෘතිවලින් ගිණුම්කරණ තොරතුරු ස්වයංක්‍රීයව උත්පාදනය කිරීම සඳහා ගිණුම්කරණ ඒකකවල පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව සඳහා අවශ්‍ය සහාය ලබාදීම.**
- **කාලීන හා ගුණාත්මක තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු ලබා දීම.**

1.3 ප්‍රධාන කාර්යයන්

1. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීම සඳහා මධ්‍යගත ගිණුම්කරණ පද්ධතියක් පවත්වාගෙන යාම.
2. රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පරිගණකගත ගිණුම්කරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ වෙනස්වන අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයට ඒවා යාවත්කාලීන කිරීම.
3. ගිණුම්කරණ පද්ධතිය පවත්වා ගෙන යාමට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශ නිකුත් කිරීම හා ඒ සඳහා ගිණුම්කරණ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
4. ගිණුම්කරණ තොරතුරු විගණකාධිපතිවරයාට, ශ්‍රී ලංකා මහ බැංකුවට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට, ආසියානු සංවර්ධන බැංකුවට හා ඒ හා සමාන ආයතනවලට සම්පාදනය කිරීම.

5. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි වාර්ෂිකව රජයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

6. රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය සහාය ලබා දීම.

7. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම, තැන්පත් ගිණුම හා අනෙකුත් ප්‍රධාන ගිණුම් අධීක්ෂණය කිරීම.

8. විදේශ රජයන්හි සේවය කරන ලද ශ්‍රී ලාංකිකයන්ට විශ්‍රාම වැටුප් ලබා දීම සඳහා අත්තිකාරම් ගිණුමක් පවත්වාගෙන යාම.

9. ඇප ආඥා පනතේ 612 අධිකාරය 2 (ඇ) වගන්තිය අනුවත්, මුදල් රෙගුලාසි අංක 880-893 අනුවත් රජයේ නිලධාරීන්ට ඇප සහතික නිකුත් කිරීම.

10. රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොතට අනුව රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීම.

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1. මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති අංශය

- නව පරිගණකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම්කරණ පද්ධතිය (CIGAS)
- භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හා උපකාරක සේවා
- වැටුප් මෘදුකාංග පද්ධතිය හා උපකාරක සේවා (GPS)

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වාර්තාකරණ අංශය

- මූල්‍ය වාර්තාකරණ
- ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. මුදල්, තැන්පතු ගිණුම් හා අත්තිකාරම් ගිණුම් අධීක්ෂණ අංශය

- මූල්‍ය කළමනාකරණය
- ප්‍රධාන ලෙජර ගිණුම් හා විවිධ ගිණුම්

4. මූල්‍ය තොරතුරු විශ්ලේෂණ අංශය

- රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණ
- මානව සම්පත් කළමනාකරණ හා ආයතනික කටයුතු

1.5 සංවිධාන ව්‍යුහය



පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ආයතන විසින් මහජන මුදල් සම්බන්ධයෙන් සිදු කරනු ලබන කටයුතු වඩාත් විනිවිදභාවයෙන් හා නිවැරදිව ගිණුම්ගත කර වාර්තා කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා මාර්ගෝපදේශයන් නිකුත් කරනු ලබන අතර ඒ තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මහජන විශ්වාසය තහවුරු කිරීමට කටයුතු කර ඇත. පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුගත වෙමින් රාජ්‍ය මූල්‍ය වාර්තාකරණ කටයුතු ඉටුකිරීමටත් ඒ තුළින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍යවන්නාවූ තොරතුරු සම්පාදනය කිරීමටත් මෙම දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

පසුගිය කාලය සැලකිල්ලට ගැනීමේ දී, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාවය, විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සැලකිය යුතු කාර්ය භාරයක් ඉටුකර ඇත. එහි දී ශක්තිමත් මූල්‍ය වාර්තාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමෙන් සහ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම, අයවැය අධීක්ෂණය හා විගණන කටයුතු සඳහා පහසුකම් සැලසීම තුළින් එය වඩාත් තහවුරු කර ඇත.

තවදුරටත් ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය මූල්‍ය වාර්තාකරණයේ විනිවිදභාවය ප්‍රවර්ධනය කර මූල්‍ය විනය සාක්ෂාත් කර ගැනීමටත් ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍ය මූල්‍ය වාර්තාකරණය ශක්තිමත් කිරීම තුළින් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට දායකත්වය සපයනු ලැබේ.

ඒ සඳහා දියුණු තාක්ෂණය භාවිතයට ගැනීමත්, මූල්‍ය වාර්තාකරණ සඳහා නව ක්‍රමවේදයක් හඳුන්වා දීමටත්, රාජ්‍ය මූල්‍ය වාර්තාකරණ අභියෝගවලට මුහුණ දීම සඳහා මානව සම්පතේ ධාරිතාවය ඉහළ නැංවීම සහ පවත්නා ගිණුම්කරණ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමුකර දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සැලසුම් කර ඇත.

2.1 නව පරිගණකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම්කරණ පද්ධතිය (New CIGAS)

රාජ්‍ය මූල්‍ය තොරතුරු වාර්තාකරණය වැඩිදියුණු කිරීම, කාර්යක්ෂමතාව සහ ඒවායේ ගුණාත්මකභාවය පවත්වාගෙන යාම පිණිස අප දෙපාර්තමේන්තුවේ ශිල්පීය දැනුම තුළින් නිර්මාණය කරන ලද New CIGAS මෘදුකාංගයෙහි තවදුරටත් සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් 2025 වර්ෂයේ දී සිදු කරන ලදී. ඒ අනුව, නව අවශ්‍යතා හා පරිශීලක ප්‍රතිචාරවලට අනුව New CIGAS ගිණුම් පද්ධතිය අඛණ්ඩව සංවර්ධනය කිරීම මඟින් යාවත්කාලීන කරන ලද මූල්‍ය වාර්තාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

මාසිකව සියලු ම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල මාසික ගිණුම් සාරාංශ ඒකාබද්ධ කර New CIGAS වෙබ් අතුරු මුහුණත වෙත උඩුගත කිරීම තුළින් පරිශීලකයන්ට තම ගිණුම් තොරතුරු

භාණ්ඩාගාරයේ වාර්තා ගත වී ඇති තොරතුරු සමඟ සංසන්දනය කර වැරදි අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරන ලදී.

නිතිපතා New CIGAS මෘදුකාංගය පරිශීලනය කරන්නන්ගෙන් වාර්තා වන වැරදි හා අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍යවන තාක්ෂණික සහය ලබා දීමට හැකි වන පරිදි සහයක නිලධාරීන් අඛණ්ඩව පුහුණු කිරීම හා එම සහය ලබාදීමට කටයුතු සිදු කරන ලදී. එමෙන් ම, New CIGAS ගිණුම්කරණ මෘදුකාංගය භාවිත කරන අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ඔවුන් කාලීනව දැනුවත් කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

තව ද, 2025 වර්ෂය තුළ දී අඛණ්ඩව මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමට අදාළව New CIGAS පද්ධතියෙහි ඇතුළත් වත්කම් මොඩියුලය භාවිත කිරීම පිළිබඳව නිලධාරීන් Zoom තාක්ෂණය මඟින් හා පුහුණු සැසි මඟින් දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. එමඟින් සියලු ම රාජ්‍ය ආයතනවල වත්කම් මිල දී ගැනීම් වත්කම් මාරු කිරීම් මෙන් ම අපහරණය කිරීම යන කාර්යයන් විධිමත්ව හා නිවැරදිව වාර්තා කිරීමට හැකියාව ලැබුණි.

එමෙන් ම, සියලු ම රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල බැරකම් New CIGAS වැඩසටහන හරහා භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට පහසුකම් සපයන ලද අතර එම බැරකම් New CIGAS වෙබ් අතුරු මුහුණත වෙත උඩුගත කිරීම තුළින් නැවත ඒවායේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට හැකිවන පරිදි පරිශීලකයන්ට පහසුකම් සපයන ලදී.

2025 වර්ෂය තුළ New CIGAS ගිණුම් පද්ධතිය භාවිත කරන නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර එමඟින් නිලධාරීන් 350ක් පුහුණු කරන ලදී. එම පුහුණු වැඩසටහන් පිළිබඳව සංක්ෂිප්ත වාර්තාව පහත පරිදි වේ.

	ස්ථානය	කාල පරාසය	ආයතනය	නිලධාරීන් සංඛ්‍යාව
01	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.09.10 දින	වයඹ පළාත් සභාව (Zoom තාක්ෂණය මඟින්)	ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරින් 60 දෙනෙක් සඳහා
02	නාවික හමුදා මූලස්ථානය	2025.09.03 දින	ශ්‍රී ලංකා නාවික හමුදාව	ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරින් 15 දෙනෙක් සඳහා
03	මෙට්‍රොපොලිටන් කැම්පස් (මිලෝදා ආයතනය)	2025.10.16 සිට 2025.10.17 දක්වා	සෞඛ්‍ය අමාත්‍යාංශය	ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරින් 94 දෙනෙක් සඳහා

	ස්ථානය	කාල පරාසය	ආයතනය	නිලධාරීන් සංඛ්‍යාව
04	යුද්ධ හමුදා මූලස්ථානය	2025.10.22 දින	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරීන් 38 දෙනෙක් සඳහා
05	පොලිස් අභ්‍යාස විද්‍යාලය, කළුතර	2025.11.14 හා 15 සහ 2025.11.21 හා 22 යන දිනයන්හි	ශ්‍රී ලංකා පොලිසිය	ගණකාධිකාරිවරුන් හා විෂය නිලධාරීන් 143 දෙනෙක් සඳහා

2.2 භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය [Integrated Treasury Management Information System (ITMIS)]

2025 වර්ෂය තුළ, මධ්‍යම රජයට අයත් සියලු ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විශේෂ වියදම් ඒකක ITMIS පද්ධතිය තුළට ඇතුළත් කර ගැනීමට හැකි විය. ඒ අනුව 2025 වර්ෂය ආරම්භ වන විට ඉතිරිව තිබූ වියදම් ශීර්ෂ 08කට අයත් වියදම් ඒකක 541 සඳහා 2025 වර්ෂය තුළ ITMIS මූලික මොඩියුලයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

පද්ධතිය ආරම්භයේ දී නාමික පරිශීලක බලපත්‍ර 5000ක් ලබා ගෙන තිබූ අතර එම පරිශීලක බලපත්‍ර මගින් වියදම් ඒකක 850ක් නියෝජනය කරමින් වැය ශීර්ෂ 164ක් පද්ධතිය තුළ සජීවීව ක්‍රියාත්මක කර තිබුණි. 2025 වර්ෂයේ දී, නව වියදම් ශීර්ෂ 08 ක්‍රියාත්මක කිරීමට පද්ධතියේ පැවති නාමික පරිශීලක බලපත්‍ර (Named user license), සමගාමී බලපත්‍ර (concurrent user license) බවට පරිවර්තනය කරන ලදී. ඒ අනුව, 2025 අයවැය ලේඛනයට අනුව, සියලු ම අයවැය ශීර්ෂ සඳහා මූලික මොඩියුල පිළිබඳ පුහුණු ක්‍රියාකාරකම් සාර්ථකව නිම කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට හැකි විය. 2025 වසර අවසන් වන විට, විදේශ කටයුතු අමාත්‍යාංශය හා ඊට අයත් විදේශ දූත මණ්ඩල 63 ද ඇතුළුව වියදම් ඒකක 1391ක් නියෝජනය කරන වැය ශීර්ෂ 172ක් පද්ධතිය තුළ සජීවීව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

භාණ්ඩාගාර ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) භාවිත කරන සියලු ම ආයතන තම අග්‍රිම අවශ්‍යතා පද්ධතිය තුළින් සපුරා ගනු ලබන අතර එම ආයතන විසින් දිනපතා පද්ධතියට ඇතුළත් කරන ගෙවීම් වවුචර් මත පදනම්ව, මුදල් අවශ්‍යතාවය තීරණය කර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් (අග්‍රිම) නිකුත් කරනු ලැබේ. එබැවින්, ITMIS පද්ධතිය සමඟ සජීවීව ක්‍රියාත්මක වන වියදම් ඒකක 1391ට ඔවුන්ගේ බැංකු ගිණුම්වල අතිරික්ත මුදල් රඳවා ගැනීමට ඇති හැකියාව අවම වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය හා ආවස්ථික පිරිවැය අඩු කර ගත හැකි වී ඇත.

අලුතින් පද්ධතියට එක් කළ ආයතන සඳහා 2025 වර්ෂය තුළ දින 04ක පුහුණු සැසි 06ක් මගින් පරිශීලකයින් 4708කට මාර්ගගත ක්‍රමවේදය (Zoom) ඔස්සේ මූලික මොඩියුල පිළිබඳ පුහුණුව ලබා දීමට කටයුතු කරන ලද අතර රාජ්‍ය ආයතනයන්හි කාර්ය මණ්ඩල නව බඳවාගැනීම්, ස්ථාන මාරුවීම හා සේවය හැර යාම් වැනි කරුණු හේතුවෙන් ITMIS සඳහා සම්බන්ධ වූ නව පරිශීලකයින් 162 දෙනෙකුට මූලික මොඩියුල පිළිබඳ භෞතික පුහුණුව ලබා දීමට කටයුතු කරන ලදී.

මීට අමතරව, රජය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අතර ඇතිකරගත් එකඟතාවයකට අනුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 02/2025 හා 2025 ජූලි 17 දිනැති චක්‍රලේඛයේ උපදෙස් පරිදි, ගැනුම් ඇණවුම් (Purchase Orders) සහ ඉන්වොයිස් පත් (Invoices) පරිශීලක ආයතනවලට ලැබී දින 15ක් ඇතුළත පද්ධතියට ඇතුළත් කිරීම 2025 සැප්තැම්බර් මස සිට ආරම්භ කරන ලදී. ඒ සඳහා අවශ්‍ය පුහුණුව, පුහුණු සැසි 04ක් හරහා මාර්ගගත ක්‍රමවේදය (Zoom) භාවිත කරමින්, සියලු ම අදාළ පරිශීලකයන් වෙත ලබා දීමට කටයුතු කර ඇත.

මුදල් සැලසුම්කරණ මොඩියුලය (Cash Planning Module), භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි අලුතින් හඳුනා ගන්නා ලද ක්‍රියාකාරකම් හා වාර්තා ද ඇතුළත් කරමින් සංවර්ධනය කිරීමටත්, රාජ්‍ය බැංකු අතුරු මුහුණත් ලෙස පද්ධතියට සම්බන්ධ කිරීමටත් අවශ්‍ය පසුබිම සකස් කිරීමට අමතරව මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය (Cadre Management) හා වත්කම් කළමනාකරණ ක්‍රියාවලිය (Asset Management) සම්බන්ධ මොඩියුල පද්ධතියට එක් කිරීම සම්බන්ධයෙන් ද 2025 වර්ෂයේ දී අවධානය යොමු විය.

ITMIS පද්ධතිය පරිශීලනය කරනු ලබන 7589ක් පමණ වූ පරිශීලකයින් සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ සහාය සේවාවන් 2025 වර්ෂය තුළ දී සපයන ලදී. විශේෂයෙන් මාසය අවසානයේ දී පරිශීලකයින් අත්විඳින ප්‍රධාන ගැටලුව ලෙස ITMISහි මන්දගාමී බව හඳුනාගෙන ඇති අතර පද්ධතිය සුමටව ක්‍රියාත්මක වන පරිදි ගැටලුව නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. යෙදුම් සේවා සපයන්නා (Free balance inc.) සහ යටිතල පහසුකම් සේවා සපයන්නා (N-able Pvt Limited) යන ආයතනයන්ගේ සහයෝගයෙන්, මෙම ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ.

2025 වර්ෂය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

අලුතින් පද්ධතියට එක් කළ නව ආයතන සඳහා මූලික මොඩියුල සම්බන්ධයෙන් පැවැත්වූ මාර්ගගත (online) පුහුණු වැඩසටහන්

අනු අංකය	ස්ථානය	කාල පරාසය	ආයතන	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.01.21 සිට 2025.01.24 දක්වා	බන්ධනාගාර දෙපාර්තමේන්තුව / කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	749
02	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.03.04 සිට 2025.03.07 දක්වා	අධ්‍යාපන අමාත්‍යාංශය,සමෘද්ධි දෙපාර්තමේන්තුව සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව	1718
03	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.05.08 සිට 2025.05.10 දක්වා	අධිකරණ පරිපාලන	1784
04	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.12 සිට 2025.08.15 දක්වා	විදේශ කටයුතු අමාත්‍යාංශය - පළමු කණ්ඩායම	218
05	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.18 සිට 2025.08.21 දක්වා	විදේශ කටයුතු අමාත්‍යාංශය - දෙවන කණ්ඩායම	199
06	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.21 සිට 2025.08.24 දක්වා	විදේශ කටයුතු අමාත්‍යාංශය - තෙවන කණ්ඩායම	40
මුලු එකතුව				**4708**

2025 වර්ෂය තුළ ගැනුම් ඇණවුම් හා ඉන්වොයිස් පත් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පැවැත්වූ මාර්ගගත (online) පුහුණු වැඩසටහන්

අනු අංකය	ස්ථානය	කාල පරාසය	කණ්ඩායම / ආයතනය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.27 දින (උදය වරුව)	සිංහල මාධ්‍ය පළමු කණ්ඩායම	984
02	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.27 දින (සවස් වරුව)	සිංහල මාධ්‍ය දෙවන කණ්ඩායම	786
03	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.08.28 දින	දෙමළ මාධ්‍ය තෙවන කණ්ඩායම	586
04	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.09.23 දින	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	120
මුලු එකතුව				**2476**

2025 වර්ෂය තුළ අලුතින් එකතු වූ දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා දැනට ITMIS ක්‍රියාත්මක වන ආයතනවල නිලධාරීන් සඳහා මූලික මොඩියුල සම්බන්ධයෙන් පැවැත්වූ භෞතික පුහුණු වැඩසටහන්.

අනු අංකය	ස්ථානය	කාල පරාසය	ආයතන	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.03.18 සිට 2025.03.21 දක්වා	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	20
02	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.03.25 සිට 2025.03.28 දක්වා	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	10
03	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව	2025.03.25 සිට 2025.03.28 දක්වා	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	10
04	ගුවන් හමුදා මූලස්ථානය	2025.09.19 දින	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	70
05	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය	2025.11.10 සිට 2025.11.13 දක්වා	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	52
මුළු එකතුව				**162**

2.3 මූල්‍ය වාර්තාකරණය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

<u>රජයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම.</u>

වාර්තාකරණ කාල සීමාව තුළ, 2024 වර්ෂය සඳහා රජයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ව්‍යවස්ථාපිත කාලසීමාව තුළ විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද සියලු ම විගණන විමසුම් සඳහා අවශ්‍ය පැහැදිලි කිරීම් විධිමත් ලෙස නියමිත වේලාවට ඉදිරිපත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානවලට අනුකූලව, 2024 සිව්වන කාර්තුව සහ 2025 පළමු කාර්තු තුන සඳහා මූල්‍ය කාර්ය සාධන වාර්තා සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර එම මූල්‍ය තොරතුරු මහජන ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ ද ප්‍රකාශයට පත් කරන ලදී.

වසර තුළ පැන නගින ලද ගිණුම්කරණ ගැටලු විසඳීම සඳහා අයවැය අස්ථිත්වවලට අඛණ්ඩ මඟ පෙන්වීමක් ලබා දෙන ලදී. නියමිත කාලසීමාව තුළ 2025 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට

පහසුකම් සලසමින් වාර්ෂික ගිණුම් වසා දැමීම සහ අයවැය අස්ථිත්ව සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳ සවිස්තරාත්මක මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

<u>මූල්‍ය වාර්තාකරණය ශක්තිමත් කිරීම සහ ප්‍රතිසංස්කරණ සඳහා මූලික කටයුතු සිදු කිරීම.</u>

මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මඟ පෙන්වීමට අනුකූලව, උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමවේදයට මාරුවීමට පෙර විසඳිය යුතු ප්‍රධාන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (APFA) සාමාජිකයින් සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර සාකච්ඡා පැවැත්විණි.

රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ නිර්දේශ මත පදනම්ව, රජයේ මූල්‍ය වාර්තාකරණය ශක්තිමත් කිරීම සඳහා තාක්ෂණික මඟ පෙන්වීම සහ උපචිත පදනම මත ගිණුම්කරණ ක්‍රමවේදයට මාරුවීම අධීක්ෂණය කිරීම සඳහා පූර්ණ බලය සහිත පාලන කමිටුවක් පිහිටුවන ලදී. ප්‍රධාන ව්‍යුහාත්මක සහ තාක්ෂණික අභියෝග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා කමිටුවේ රැස්වීම් තුනක් 2025 මැයි 19, 2025 ජූනි 23 සහ 2025 නොවැම්බර් 21 යන දිනවල පවත්වන ලදී.

ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහාය වීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් (Working Group) පත් කරන ලද අතර වර්ෂය තුළ එම ක්‍රියාකාරී කණ්ඩායම පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සම්පූර්ණ කරන ලදී:

- නාමික ගිණුම් ඉවත් කිරීම පිළිබඳ අවසන් වාර්තාව
- මූල්‍ය නොවන වත්කම් සඳහා කෙටුම්පත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය
- උපචිත ගිණුම්කරණයට මාරුවීම සඳහා කෙටුම්පත් මාර්ග සිතියම
- කෙටුම්පත් කැබිනට් පත්‍රිකාව

සම්පූර්ණ කරන ලද සියලු ම කාර්යයන් සඳහා පූර්ණ බලය සහිත පාලන කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

<u>2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ මූල්‍ය රෙගුලාසි කෙටුම්පත් සකස් කිරීම.</u>

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් මූල්‍ය රෙගුලාසි සකස් කරන ලදී. වාර්තාකරණ කාලය තුළ, කෙටුම්පත් රෙගුලාසි ජාත්‍යන්තර හොඳ ම භාවිතයන් සමඟ තවදුරටත් සංස්කරණය කිරීම සහ පෙළගැස්වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිලධාරීන් සමඟ උපදේශන සාකච්ඡා තුනක් පවත්වන ලදී.

ඊට අමතරව, අන්තර්විෂයීය (Cross-Cutting) ගැටලු විසඳීමට සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ කාර්යයන් අතර අනුකූලතාව සහතික කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

<u>රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.</u>

වර්ෂය තුළ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධති ශක්තිමත් කිරීම සඳහා ප්‍රමුඛතා ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග සහ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ කාලරාමු සකස් කිරීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් සමඟ සාකච්ඡා දෙකක් පවත්වන ලදී.

<u>ගිණුම්කරණ සටහන (Chart of Accounts) සකස් කිරීම.</u>

ගිණුම්කරණ සටහන සකස් කිරීමේ ක්‍රියාකාරී කණ්ඩායමට සහාය වීම සඳහා 2025 වසර තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය සඳහා පැමිණි දූත මණ්ඩල මෙහෙයුම් දෙකක් පවත්වන ලදී. ජූලි 14 සිට 25 දක්වා සහ දෙසැම්බර් 8 සිට 12 දක්වා පැවති මෙම මෙහෙයුම්, ගිණුම්කරණ වර්ගීකරණ සටහනේ ආර්ථික වර්ගීකරණය සහ වැඩසටහන්/ව්‍යාපෘති වර්ගීකරණයේ සංවර්ධනය සඳහා තාක්ෂණික සහාය ලබා දීම මෙන් ම අරමුදල් වර්ගීකරණය, සංවිධාන ව්‍යුහය වර්ගීකරණය සහ ස්ථානීය වර්ගීකරණය සමාලෝචනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

දෙසැම්බර් මස පවත්වන ලද තාක්ෂණික සහාය මෙහෙයුම අතරතුර, එක් එක් අමාත්‍යාංශය යටතේ වැඩසටහන් සහ ව්‍යාපෘති නිවැරදිව හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීම සඳහා සියලු ම අමාත්‍යාංශ සමඟ සාකච්ඡා සැසි පවත්වන ලදී.

ඒ අනුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නායකත්වයෙන් යුත් ක්‍රියාකාරී කණ්ඩායම විසින් ගිණුම්කරණ සටහනේ ආර්ථික අංශය සකස් කිරීම ආරම්භ කරන ලදී. වැඩසටහන් සහ ව්‍යාපෘති අංශ සකස් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය සිදු කරන ලදී.

<u>ප්‍රධාන ලෙජර් ගිණුම් විවෘත කිරීම සහ නඩත්තු කිරීම.</u>

ප්‍රධාන ලෙජර් ගිණුම් 7 ක් සහ උප-ලෙජර් ගිණුම් 109 ක් විවෘත කරන ලද අතර සියලු ම ප්‍රධාන ලෙජර් ගිණුම් සඳහා කාර්තුමය සැසඳීම් සිදු කරන ලදී. දුම්රිය දෙපාර්තමේන්තුවේ දිගුකාලීනව නොපියවී පැවති ශේෂය පිළිබඳ අඛණ්ඩ පසු විපරම් සිදු කරන ලද අතර, එම ශේෂය සම්පූර්ණයෙන්ම පියවීමට කටයුතු කරන ලදී.

2.4 වැටුප් මෘදුකාංග

රජයේ වැටුප් මෘදුකාංගය (Government Payroll System – GPS)

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල වැටුප් සැකසීම සඳහා භාවිත කරන රජයේ වැටුප් සැකසීමේ මෘදුකාංගයෙහි (Government Payroll System – GPS) අධීක්ෂණ කටයුතු, නඩත්තු කිරීම හා පුහුණු කටයුතුවල වගකීම මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඒ අනුව, වැටුප් සකස් කිරීමේ දී මතුවන ගැටලු නිරාකරණය කර ගැනීමට සහය ලබා දීම, රජයේ ආයතනවල ඉල්ලීම් අනුව මෘදුකාංගයේ පිටපත් ලබාදීම හා යාවත්කාලීන කිරීම, මෘදුකාංගයේ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී උපකාරක සේවාවන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

2025 වර්ෂයේ දී ඉටුකළ කාර්යයන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

කාර්යය	
නිකුත්කළ නව GPS පිටපත් සංඛ්‍යාව	36
යාවත්කාලීන කළ GPS පිටපත් සංඛ්‍යාව	56
පවත්වන ලද GPS පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	04
පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	103

නව e-payroll වැඩසටහන

දැනට ක්‍රියාත්මක වන රජයේ වැටුප් මෘදුකාංගයෙහි පවතින අඩුපාඩු අවම කර ගැනීමේ අරමුණ ඇතිව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) අතර සම්බන්ධීකරණයෙන් හඳුන්වා දෙන ලද නව e-payroll වැඩසටහන මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු 15ක් තුළ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.

2.5 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන හා මූල්‍ය නොවන වත්කම් ගිණුම්කරණ

මධ්‍යම රජය සතු ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට සහාය වීම.

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් හා ගොඩනැගිලි 651ක තක්සේරු වාර්තා පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2025 වර්ෂයේ දී ලැබී ඇති අතර, එම තක්සේරු වටිනාකම් ගිණුම්ගත කරන ලෙස දන්වමින් අදාළ ආයතන වෙත ලිපි යොමු කර ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරන ලදී.



ඒ තුළින් 2025 වර්ෂයේ මෙම ක්‍රියාවලියේ ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි වූ අතර, රුපියල් බිලියන 4,002.7ක් වූ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමක් ගිණුම් ගත කිරීමට මෙමගින් හැකි වී ඇත.



රාජ්‍ය ආයතනයන්හි ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම හා ගිණුම්ගත කිරීමේ වැඩසටහන යටතේ එක් එක් රාජ්‍ය ආයතනයන්ට අදාළව එහි ප්‍රගතිය විමසා බැලීමට එක් එක් රාජ්‍ය ආයතන මඟින් වෙන් වෙන් වශයෙන් ඉඩම් හා ගොඩනැගිලිවලට අදාළ තොරතුරු ආකෘති 03ක් යටතේ ගෙන්වා ගැනීමට කටයුතු කරන ලදී. ඒ අනුව රාජ්‍ය ආයතන 88ක තොරතුරු අදාළ ආකෘතින් අනුව සම්පූර්ණ කර මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

ආයතනවල තක්සේරු කිරීමට ඇති ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව යොමු කරන ලද තොරතුරු වාර්තා පරීක්ෂා කර එම ආයතන සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙමින් තක්සේරු දෙපාර්තමේන්තුව ද දැනුම්වත් කරමින් ඉදිරියේ දී කඩිනමින් එම තක්සේරු කිරීම් සිදුකර ගන්නා ලෙසත් ඒවා ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා ලිපි යොමු කරන ලදී.

<u>රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන 2014 අත්පොතට අනුව පිළියෙල කිරීම.</u>

2024 වර්ෂයේ අයවැයගත මධ්‍යම රජයේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන 2014 අත්පොතට අනුව සකස් කිරීම සිදු කළ අතර එම සංඛ්‍යාන අවශ්‍ය කටයුතු සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී. තව ද, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුළු ආදායම් හා වියදම් තොරතුරු සහ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන තොරතුරු අතර සැසඳීම් ද සකස් කරන ලදී.

උපායමාර්ගික (Extra budgetary) ආයතන නියැදියෙහි මූල්‍ය තොරතුරු ආයතනවලින් ලබා ගෙන රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කරන ලදී.

සියලු ම පළාත් සභාවල 2024 වර්ෂයේ මූල්‍ය තොරතුරු රැස් කර රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කරන ලදී.

<u>පාර්ලිමේන්තු, රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහභාගී වීම හා ඊට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.</u>

2025 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් වාර 14ක් පැවැත්වූ අතර ඒ සඳහා ඉදිරිපත් කෙරෙන මහා භාණ්ඩාගාර වාර්තාවට අවශ්‍ය ගිණුම් වාර්තා හා මූල්‍ය කාර්යසාධනය සම්බන්ධ තොරතුරු සකස් කර ඉදිරිපත් කරන ලදී. තව ද, එම රැස්වීම් සඳහා සහභාගී වූ දෙපාර්තමේන්තු නියෝජිතයින් විසින් රැස්වීම්වල දී මතු කරන ලද ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ වෘත්තීය මැදිහත්වීම ලබා දෙන ලදී.

<u>පළාත් සභාවල මාසික මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කර වාර්තාවක් සකස් කිරීම.</u>

2025 වර්ෂයේ පළාත් සභාවල මාසික ආදායම් වියදම් වාර්තා ලබාගෙන සකස් කරනු ලබන වාර්ෂික තොරතුරු රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීමට කටයුතු කරන ලදී.

2.6 මුදල්, තැන්පතු ගිණුම් හා අත්තිකාරම් ගිණුම්

<u>රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් කටයුතු</u>

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම්වලට අදාළව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර වෙනස්කම් පවතින ආයතන 26ක් හඳුනාගන්නා ලද අතර එම වෙනස්කම් නිරවුල් කරගැනීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික සහාය හා උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

2025 වර්ෂයට අදාළව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම්වල කාල විශ්ලේෂණය අනුව පවතින හිඟ ණය ශේෂ නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියා මාර්ගයන්හි ප්‍රගතිය විමසමින් ආයතන 121ක් වෙත අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. තව ද, එක් එක් රාජ්‍ය ආයතනවල රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම් සම්බන්ධයෙන් පවතින අනෙකුත් ගැටලු නිරවුල් කර ගැනීම සඳහා එම ආයතන වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

2024.12.31න් අවසන් වර්ෂයේ අත්තිකාරම් "බී" ගිණුම් වාර්තා අනුව අවුරුදු 10ට වඩා පැරණි අය නොවී පවතින ණය ශේෂ අය කර ගැනීමට හෝ කපා හැරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සඳහා එම ආයතන කැඳවා උපදෙස් ලබා දීමට කටයුතු කිරිම ආරම්භ කරන ලදී. ඒ අනුව, වැඩිම ණය ශේෂ පවතින ආයතන දෙකක් කැඳවා උපදෙස් ලබා දෙන ලදී.

<u>**පොදු තැන්පත් ගිණුම**</u>

අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල පොදු තැන්පත් ගිණුම් සැසඳුම් ප්‍රකාශ හා කාල විශ්ලේෂණ වාර්තා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගැනීමට කටයුතු කරන ලද අතර 2024 වර්ෂයට අදාළව 2025 වසර මුල් කාර්තුව තුළ ලැබිය යුතු ගිණුම් වාර්තා 170 ම සන්සන්දනය කිරීමට කටයුතු කරන ලදී. ඒ අතුරින් නොසැසඳුන ශේෂ සම්බන්ධ පසුවිපරම් කර එම ශේෂ සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබා දෙන ලදී. කල් ඉකුත් වූ ශේෂ නිරවුල් කිරීම සම්බන්ධව ආයතන 35ක් සඳහා උපදෙස් ලබාදී ඇත.

2025 වර්ෂය සඳහා නව පොදු තැන්පත් ගිණුම් 40ක් විවෘත කිරීමට කටයුතු කරන ලද අතර භාවිත නොවන තැන්පත් ගිණුම් 14ක් අක්‍රීය කරන ලදී.

2025 වර්ෂය සඳහා අමාත්‍යාංශවල වැයශීර්ෂ වෙනස්වීමත් සමඟ, තැන්පත් ගිණුම් අමාත්‍යාංශ අතර මාරුකිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව, අමාත්‍යාංශ 8ක තැන්පත් ගිණුම් 23ක් ඒ ඒ අමාත්‍යාංශ අතර මාරුකරන ලදී.

<u>**විදේශ රාජ්‍ය වෙනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වූ අනුමත භාණ්ඩාගාර අත්තිකාරම් ගිණුම**</u>

විදේශීය රාජ්‍යවල (සිංගප්පූරුව, මැලේසියාව හා එක්සත් රාජධානිය) සේවය කර එම ආණ්ඩුවලින් විශ්‍රාම වැටුප් ලබන ශ්‍රී ලංකාවේ ජීවත් වන විශ්‍රාමික නිලධාරීන් සහ වැන්දඹුවන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මෙම ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

2025 වර්ෂය තුළ දී මෙම අත්තිකාරම් ගිණුම යටතේ වැන්දඹුවන් පස්දෙනෙකු සඳහා වැන්දඹු විශ්‍රාම වැටුප් ලෙස රු.568,469 ක මුදලක් ගෙවීමට කටයුතු කරන ලද අතර 2024 වර්ෂයේ ප්‍රතිපූර්ණය නොවූ සියලු ම හිඟ මුදල් ද ඇතුළුව රු.615,903ක් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන ලදී. 2025 වර්ෂය සඳහා හිඟ ශේෂය වන රු.265,320ක මුදල 2026 වර්ෂයේ මුල් කාර්තුව තුළ දී ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම

හදිසි හා අනපේක්ෂිත අවශ්‍යතාවයන් සඳහා වියදම් දැරීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවලට අත්තිකාරම් ලබාදීම හා මු.රෙ.106 අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක මගින් වාර්තා කරන ලද මුදල් නැතිවීම ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අත්තිකාරම් ලබා දීම මෙම භාණ්ඩාගාර විවිධ අත්තිකාරම් ගිණුම මඟින් සිදුවේ.

මෙම අත්තිකාරම් ගිණුම් මඟින් පෙර වර්ෂයන්හි දී ලබාදෙන ලද අත්තිකාරම්වලින් 2025.01.01 දිනට ශේෂය රු.131,217,651ක් ලෙස පැවතිණි. එම ශේෂයෙන් රු.4,218,037ක් මෙම වර්ෂය තුළ දී නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලදී.

කෙසේ වෙතත් හිඟ ශේෂ අයකර ගැනීම සඳහා අදාළ වගකිව යුතු ආයතන හා සම්බන්ධ වෙමින් අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදෙමින් නිරන්තර පසු විපරම් කිරීම තුළින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව, 2025 වර්ෂය තුළ දී අත්තිකාරම් නිරවුල් කළ යුතු සියලු ම ආයතන සම්බන්ධ කරගනිමින් රැස්වීම් වාර 04ක් පැවැත්වීමට කටයුතු කරන ලදී. එහි දී එකඟ වූ පරිදි හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගතයුතු ඉදිරි පියවර සම්බන්ධයෙන් වන තීරණය ගැනීම සඳහා භාණ්ඩාගාර

නියෝජ්‍ය ලේකම් විසින් කමිටුවක් පත්කරන ලද අතර, අදාළ කමිටුව මේ සම්බන්ධයෙන් නිරන්තර පසුවිපරමින් කටයුතු කරනු ලබයි.

රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය

1947 සැප්තැම්බර් 24 දින ප්‍රසිද්ධ කරනු ලැබූ අංක 9773 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පිහිටුවා ඇති රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය මුදල් රෙගුලාසි අංක 880-893 මඟින් හා 612 වැනි අධිකාරිය මඟින් පෙන්වා දී ඇති අවශ්‍යතාවය පරිදි පවත්වාගෙන යනු ලැබේ. ඇප තැබිය යුතු රජයේ නිලධාරීන්ගේ ඇප තැන්පත් භාර ගැනීම සහ කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වාගෙන යාම සංගමයේ අරමුණ වේ.

2025 වර්ෂයෙහි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සංගමය වෙත ඉදිරිපත් කර තිබූ අයදුම්පත් 64ක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යොමු කර සාමාජිකත්වය ලබා දීමට කටයුතු කරන ලදී. තව ද, වර්ෂය තුළ සාමාජික ගාස්තු රු. 56,125ක් අයකර ගැනීමට ද කටයුතු කරන ලදී.



2025.12.31 දිනට මෙම සංගමයේ සාමාජිකත්වය ලබාගෙන ඇති මුළු සාමාජිකයන් සංඛ්‍යාව 5,380ක් වන අතර ඇප තැන්පත් කළ යුතු රාජ්‍ය නිලධාරීන් වැඩි පිරිසක් මෙම සංගමයේ සාමාජිකත්වය මේ වන විටත් ලබාගෙන ඇත. මේ හේතුව නිසා, පෙර වර්ෂවලට සාපේක්ෂව 2025 වර්ෂයේ දී සාමාජිකත්වය ලබා ගැනීම් අඩු අගයක් පෙන්නුම් කරනු ලබයි.

සාමාජිකයින් බඳවා ගැනීම්, සාමාජික දායක මුදල් ලැබීම් හා දායක මුදල් නැවත ගෙවීම් ඇතුළු අනෙකුත් සාමාජික තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය යාවත්කාලීන කර ඇත.

ඩබ්ලිව්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පරිච්ඡේදය 03 - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ACA-F

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තථ්‍ය 2025 රු.	තථ්‍ය 2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ACA-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ACA-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ACA-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	ACA-1
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		144,677,750	292,514,000	ACA-3
-	තැන්පතු		138,968	864,208	ACA-4
-	අත්තිකාරම් ගිණුම්		11,653,464	7,859,738	ACA-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		35,793,371	41,674	සටහන 8
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		192,263,553	301,279,620	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		192,263,553	301,279,620	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		35,783,202	13,922,500	
-	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		156,480,350	287,357,120	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
108,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	107,419,216	90,683,514	ACA-2(ii)
26,850,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	22,802,728	24,939,800	ACA-2(ii)
1,450,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	899,460	1,234,139	ACA-2(ii)
-	පොලී ගෙවීම්	8	-	-	ACA-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	ACA-2(ii)
137,100,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		131,121,403	116,857,453	
	මූලධන වියදම්				
1,295,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	1,140,143	432,676	ACA-2(ii)
123,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	2,770,603	19,346,852	ACA-2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ACA-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	ACA-2(ii)
3,000,000	හැකියා වර්ධනය	14	891,236	1,422,506	ACA-2(ii)
4,205,000	වෙනත් මූලධන වියදම්	15	-	-	ACA-2(ii)
131,500,000	මුළු මූලධන වියදම් (උ)		4,801,981	21,202,034	
	තැන්පතු ගෙවීම්		138,993	1,119,768	ACA-4
	අත්තිකාරම් ගෙවීම්		10,082,652	10,268,309	ACA-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		2,663,005	142,201,020	සටහන 9
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		12,884,651	153,589,097	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		148,808,035	291,648,584	
268,600,000	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		7,672,315	(4,291,464)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		7,672,315	(4,291,464)	ACA-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ACA-3
			7,672,315	(4,291,464)	

1

අයි.පී.එන්.ඒ. පත්මසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (...)
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	සත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	64,933,805	62,546,742
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5	145,488,055	147,058,867
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**210,421,860**	**209,605,609**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		145,488,055	147,058,842
දේපළ පිරියත හා උපකරණ සංචිතය		64,933,805	62,546,742
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4		25
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
		210,421,860	**209,605,609**

පිටු අංක 8 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 29 සිට 38 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම	නම : ඩබ්.ඒ.එස්.උපනන්ද	නම : අයි.පී.එන්.ඒ.පත්මසේකර
තනතුර : ලේකම්, මුදල් අමාත්‍යාංශය	තනතුර : අධ්‍යක්ෂ ජනරාල්	තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ
දිනය :2026.02. 25	දිනය : 2026.02.20	දිනය : 2026.02.20

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

අයි.පී.එන්.ඒ. පත්මසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-5

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
මුළු බදු ලැබීම්		-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		-	-
ලාභ		-	-
ආදායම් නොවන ලැබීම්		-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්		5,976,758	4,764,287
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		35,793,371	41,674
අග්‍රිම ලැබීම්		144,677,750	292,514,000
අත්තිකාරම් අයකර ගැනීම්		8,451,067	8,134,984
තැන්පතු ලැබීම්		138,968	864,208
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)		195,037,913	306,319,154
අඩුකළා : මුදල් වැය කිරීම්			
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්		129,471,993	114,793,139
සහනාධාර සහ මාරුකිරීම්		899,460	1,234,139
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම, මූලධන මාරු කිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්		2,031,378	1,855,182
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්		11,222,375	2,027,094
වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		2,663,005	142,201,020
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම		35,783,202	13,922,500
අත්තිකාරම් ගෙවීම්		10,056,903	9,819,458
තැන්පතු ගෙවීම්		138,993	1,119,768
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)		192,267,310	286,972,301
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		2,770,603	19,346,852
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
පොළී		-	-
ලාභාංශ		-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		-	-
උපණය අයකර ගැනීම්		-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්		2,770,603	19,346,852
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		2,770,603	19,346,852
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)		(2,770,603)	(19,346,852)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
දේශීය ණය ගැනීම්		-	-
විදේශීය ණය ගැනීම්		-	-
ප්‍රදානයන් ලැබීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)		-	-
අඩුකළා : මුදල් වැය කිරීම්			
දේශීය ණය ආපසු ගෙවීම්		-	-
විදේශීය ණය ආපසු ගෙවීම්		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)		-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)		-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය		-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය		-	-

3

අයි.පී.එස්.ඒ. පත්මසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ [illegible]
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
[illegible]

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි .

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත .

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා , මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ .

6

අයි.පී.එන්.ඒ. පත්මසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ [illegible]
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

8) <u>වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්</u>

I	වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම සඳහා අනුමත අත්තිකාරම් ගිණුම යටතේ සිදු කරනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිපූර්ණයේදී සිදුවන විනිමය ලාභ 8029 ගිණුම යටතේ ගිණුම් ගත කිරීම.	=	10,169
II	රාජ්‍ය නියෝජිතයන්ගේ මුදල් ප්‍රේෂණය කිරීම් වලට අදාළව ගිණුම් සාරාංශය හරහා 8028 ගිණුමට බැර කළ මුදල	=	35,783,202
			35,793,371

9) <u>වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්</u>

I	වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම සඳහා අනුමත අත්තිකාරම් ගිණුම යටතේ සිදු කරනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රතිපූර්ණයේදී සිදුවන විනිමය අලාභ 8029 ගිණුම යටතේ ගිණුම් ගත කිරීම.	=	10,749
II	රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ බදු ගෙවීම් වලට අදාළව ගිණුම් සාරාංශය හරහා මාසිකව 8013 ගිණුමට හර කළ මුළු මුදල	=	2,652,256
			2,663,005

අයි.පී.එන්.ඒ. පත්මසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

7

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව රු.	අවසන් ඇස්තමේන්තුව රු.	ප්‍රමාණය රු.	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය රු.	අවසාන ප්‍රතිපාදනය රු.		
පුනරාවර්තන	130,500,000.00	137,100,000.00	131,121,403.28	95.63%
ප්‍රාග්ධන	131,500,000.00	131,500,000.00	4,801,981.40	3.65%

3.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවන නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම රු.	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන රු.	අවසාන ප්‍රතිපාදන රු.		
01	මැතිවරණ කොමිෂන් සභාව	**	496,189.98	496,189.98	496,189.98	100%
02	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය	***	11,200,000.00	11,200,000.00	10,726,185.25	96%

** 2025.05.06 දින පැවති පළාත් පාලන ඡන්ද විමසීමේ මැතිවරණ රාජකාරිවල නිරත වූ නිලධාරීන්ගේ දීමනා ප්‍රතිපූරණය කිරීම.

*** ITMIS පද්ධතියේ අන්තර්ජාල සම්බන්ධතාවය සඳහා වන වියදම් දැරීම.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2025 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු.	31.12.2025 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු.	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත රු.	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-			
9152	යන්ත්‍රෝපකරණ	64,933,805.06	64,933,805.06		
9153	ඉඩම්	-			
9154	අස්පෘශ්‍ය වත්කම්	-			
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-			
9160	කෙරීගෙන යන වැඩ	-			
9180	බදු දෙන ලද වත්කම්	-			

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊපීඩී/ජී/ඩීඑස්ජී/එෆ්ජී/2025/13 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය } 2026 මැයි 31 දින

15 JUN 2026

අතින් තැපැල
සාමාන්‍ය තැපැල
විද්‍යුත් තැපැල

ගණන්දීමේ නිලධාරී

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය -250 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 250 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයන් 06 ක් සහ මූලධන වැය විෂයන් 05 ක් සඳහා, අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු.12,928,142 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය.

(ආ) නිසි පරිදි අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව මුදල් රෙගුලාසි 66 මඟින් වැය විෂයන් 02 ක් සඳහා පිළිවෙලින් රු.175,000 ක් හා රු.2,900,000 ක් වශයෙන් එකතුව රු.3,075,000 ක ප්‍රතිපාදන වැඩිකරගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකල ප්‍රතිපාදන මුදලින් සියයට 100 ක් හා සියයට 31 ක් උපයෝජනය කර නොතිබුණි.

3.2 අත්තිකාරම් ගිණුම්

3.2.1 විවිධ අත්තිකාරම් ගිණුම

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ විවිධ අත්තිකාරම් ගිණුමේ (25003) හිඟ ශේෂය රු.127,067,114 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2025 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය වන රු.127,067,114 තුළ වර්ෂ 5 කට වැඩි හිඟ ශේෂය රු.125,788,810 ක් වූ අතර එය මුළු හිඟ ශේෂයෙන් සියයට 99 ක් වේ. තවද, මුළු හිඟ ශේෂයෙන් වසර 21 කටත් වඩා වැඩි හිඟ ශේෂය රු.119,467,025 ක් එනම් සියයට 94 ක් වන අතර එය 2001 සිට 2007 කාලයට අදාළ වී මිලදී ගැනීම වෙනුවෙන් පොළොන්නරුව, අනුරාධපුර, අම්පාර සහ මාතලේ යන දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතුව පැවතුණි.

(ආ) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ හිඟහිටි අත්තිකාරම් මුදල වන රු.29,297,248 හි ඇතුළත් එප්පාවල විවිධ සේවා සමුපකාර සමිතියට අදාළ රු.4,350,304 ක හිඟ ණය අත්තිකාරම සහනදායී ක්‍රමවේදයකට අනුව ගෙවීමට 2023 අගෝස්තු 21 දින එකඟ වී තිබුණි. එසේ වුවද, මෙම සමිතිය මඟින් වර්ෂයක් සඳහා ගෙවීමට එකඟ වූ වාරික මුදල වන රු.860,000 ක වාරිකය ද නිසි පරිදි ගෙවා නොතිබුණි. ඒ අනුව, 2024 හා 2025 වර්ෂයන්ට අදාළ වාරික වලින් පිළිවෙලින් රු.500,000 ක් හා රු.560,000 ක් ලෙස 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,060,000 ක් තවදුරටත් හිඟ හිටව පැවතුණි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.2.2 මධ්‍යම රජයේ, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

(අ) 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්, පළාත් සභාවල ආයතනවලට මාරු වී ගිය නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, සේවය හැරගිය නිලධාරීන්, වැඩ තහනම් කල නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන් හා වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අය විය යුතු වසර 05 ත් 10 ත් අතර ශේෂය රු.98,952,741 ක් වූ අතර වසර 10 කට වැඩි ශේෂය රු.227,573,539 ක් වී තිබුණි.

(ආ) ශීර්ෂ 03 ක් යටතේ වූ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 03 ක එකතුව රු.9,027,521 ක් වූ ශේෂයක් හා ශීර්ෂ 03 ක් යටතේ එකතුව රු.547,965 ක් වූ ඍණ ශේෂයක් නිරවුල් නොවී වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

(අ) ශීර්ෂ 03 ක් යටතේ වූ රජයේ අනුමත අත්තිකාරම් ගිණුම් 07 ක එකතුව රු.මිලියන 1,293.5 ක් වූ ශේෂයන් නිසි පරිදි නිරවුල් කිරීමකින් හෝ මුදල් රෙගුලාසි 518 ප්‍රකාරව කටයුතු කිරීමෙන් තොරව 2025 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවද, දෙපාර්තමේන්තුවට අනුයුක්තව ඇප තැබිය යුතු තනතුරක සේවය කරන නිලධාරීන් 02 දෙනෙකු 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7,920 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. මෙ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.මිලියන 6,605 ක් වැයකර තිබුණු අතර

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

සමාලෝචිත වර්ෂයේදී තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හා මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ රු. මිලියන 338 ක වියදමක්ද දරා තිබුණි. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 6,943 ක් වැයකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආසන්න වශයෙන් වසර 15 ක කාලයක් ගත වී තිබුණ ද මෙම පද්ධතිය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 ක් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක වන තත්ත්වයට පත් වී නොතිබුණි.

(ආ) තවද, මෙම ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුණ, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබු අතර, ඒ වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දින වන විට රු.6,659,742 ක වියදමක්ද දරා තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු, 135 කින් පුරප්පාඩු 41 පැවති අතර ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 11 ක්ද, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 24 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක්ද පුරප්පාඩුව පැවතුණි.

එස්. රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති (නව CIGAS අංශය)			
වැය ශීර්ෂ අනුව NEW CIGAS සහ ITMIS පද්ධති වෙත 2024 දෙසැම්බර් මස ගිණුම් වාර්තා උඩුගත කිරීම.	✓		
NEW CIGAS සහ ITMIS ගිණුම් පද්ධතිය වෙත 2025 වර්ෂයේ අයවැය තොරතුරු උඩුගත කිරීම.	✓		
වැය ශීර්ෂ අනුව NEW CIGAS සහ ITMIS ගිණුම්කරණ පද්ධති වෙත 2025 වර්ෂයේ මාසික ගිණුම් තොරතුරු උඩුගත කිරීම.	✓		
අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වල මාසික මූල්‍ය තොරතුරු NEW CIGAS වෙත උඩුගත කිරීම සහ සැකසීම.	✓		
ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වැනි ආයතන වෙත මාසිකව මූල්‍ය තොරතුරු ලබා දීම.		✓	
ආයතන විසින් ඉල්ලුම් කරන අවස්ථාවල දී පෙර වර්ෂවලට අදාළ මූල්‍ය තොරතුරු ලබා දීම.	✓		
නව අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි NEW CIGAS වැඩසටහන අඛණ්ඩව වැඩි දියුණු කිරීම.	✓		
පද්ධතිය භාවිතාකරන්නන්ගෙන් වාර්තා වන ගැටලු ප්‍රමාදයකින් තොරව නිවැරදි කර ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම.	✓		
මාසික ගිණුම් සාරාංශ නිවැරදිව ඉදිරිපත් කිරීම සඳහා පරිශීලකයන්ට මඟපෙන්වීම.	✓		
වාර්ෂික පුහුණු සැලැස්මට අනුව NEW CIGAS වැඩසටහනට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	✓		
නවතම වාර්තා උත්පාදනය කළ හැකි පරිදි NEW CIGAS අතුරු මුහුණත/වෙබ් යෙදුම තවදුරටත් සංවර්ධනය කිරීම.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති (ITMIS හා උපකාරක සේවා අංශය)			
ITMIS ක්‍රියාත්මක නොවී පවතින ආයතනවල ITMIS මූලික මොඩියුලයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.	✓		
අලුතින් ක්‍රියාත්මක වන (go-live) ආයතන විසින් සපයනු ලබන කාර්ය ප්‍රවාහ තොරතුරු මත පදනම්ව ආයතනවල නිලධාරීන්ට පරිශීලක භූමිකාවන් (user role) පැවරීම.	✓		
අලුතින් පද්ධතියට එක්කළ ආයතනවල ක්‍රියාකාරීත්වය පළමු මාසයේ සමීපව අධීක්ෂණය කර මතුවන ගැටලු නිරාකරණය කිරීම. පද්ධතිය ක්‍රියාත්මක කරගෙන යාමේ දී මතුවන ගැටලු සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම.	✓		
මධ්‍යම රජයේ ආයතන තුළ ITMIS පද්ධතිය සුමටව පවත්වා ගැනීමට අවශ්‍ය මඟ පෙන්වීම හා සහය ලබාදීම.	✓		
අවශ්‍ය අවස්ථාවන්හි දී මූලික මොඩියුලවල පුහුණු සැසි සංවිධානය කිරීම, අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.	✓		
මාසික ගනුදෙනු සැසඳුම් කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම.	✓		
අවසාන පරිශීලකයින්ට පහසුකම් සැලසීම සඳහා මූලික මොඩියුල පිළිබඳ පුහුණු වීඩියෝ සංවර්ධනය කිරීම.			✓
වත්කම් කළමනාකරණ මොඩියුලය සම්බන්ධයෙන් අවසාන පරිශීලකයන් පුහුණු කිරීම හා ආයතන තුළ ක්‍රියාත්මක කිරීම (වැය ශීර්ෂ වලින් 25%ක්).			✓
ITMIS පද්ධතියට එක් නොවූ (non-go-live) ආයතනවල මාසික CIGAS සාරාංශ ITMIS පද්ධතියට උඩුගත කිරීම.	✓		
මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධති (වැටුප් මෘදුකාංග කළමනාකරණය අංශය)			
E-Payroll මෘදුකාංග පරිශීලකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු නිරාකරණය කිරීම සඳහා අදාළ ආයතන සමඟ කටයුතු කිරීම.	✓		
වැටුප් මෘදුකාංගයේ තවදුරටත් වැඩිදියුණු කිරීම් සම්බන්ධව අදාළ ආයතනය හා ICTA ආයතනය සමඟ සම්බන්ධීකරණය කිරීම.	✓		
නව වැටුප් මෘදුකාංගය ජාතික මට්ටමින් ස්ථාපිත කිරීම.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වෙත GPS මෘදුකාංගයේ මෘදු පිටපත් නිකුත් කිරීම.	✓		
GPS වැටුප් මෘදුකාංගය භාවිතයේ දී ඇතිවන ගැටලු සඳහා තාක්ෂණික සහය ලබාදීම.	✓		
GPS මෘදුකාංගයේ භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.	✓		
ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වාර්තාකරණ අංශය			
මු.රෙ 66 මාරු කිරීම හා අතිරේක ප්‍රතිපාදන ලබාදීම මාසිකව NEW CIGAS වැඩසටහනට යාවත්කාලීන කිරීම.	✓		
එක් එක් වැය ශීර්ෂයේ ආදායම් හා වියදම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ සැසඳීම අධීක්ෂණය කිරීම.	✓		
ගිණුම් වාර්තාවල ඇති වැරදි නිවැරදි කිරීම හෝ අදාළ නිවැරදි කිරීම් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් ලබාදීම	✓		
ප්‍රධාන ලෙජර් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම.	✓		
2018 අංක 19 දරන විගණන පනත හා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව වාර්ෂික රජයේ මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	✓		
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ කාර්තුමය වාර්තා සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම හා අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කිරීම.	✓		
රජයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම්වලට අදාළ පිළිතුරු සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	✓		
මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ පළ කිරීම සඳහා විගණනය කරන ලද රජයේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපතිගේ විගණන මතය ලබාදීම.	✓		
වියදම් ශීර්ෂවල විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා විශ්ලේෂණය කිරීම.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මූල්‍ය වාර්තාකරණයට අදාළ ප්‍රතිපත්තීන් සකස් කිරීම සහ මාර්ගෝපදේශ හා චක්‍රලේඛ නිකුත් කිරීම.	✓		
ගිණුම්කරණ ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය මඟපෙන්වීම් හා පැහැදිලි කිරීම් ලබාදීම.	✓		
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නිර්දේශ පරිදි මුදල් පදනමේ සිට උපචිත පදනම දක්වා රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය වැඩි දියුණු කිරීමට අදාළව උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	✓		
විවිධ ගිණුම් (තැන්පතු හා අත්තිකාරම් ගිණුම් හා PSMGA අංශය)			
බඳවා ගනු ලබන සාමාජිකයින් සඳහා ඇප සහතික නිකුත් කිරීම.	✓		
ඇප සහතික අවලංගු කිරීම සහ සාමාජික ගාස්තු නිදහස් කිරීම.	✓		
වාර්ෂික ගිණුම් සකස් කිරීම.	✓		
විවිධ අත්තිකාරම් ගිණුම මෙහෙයවීම.	✓		
වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම මෙහෙයවීම.	✓		
විවිධ අත්තිකාරම් ගිණුම්වල වාර්ෂික සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම.	✓		
සියලු ම වියදම් ශීර්ෂ වෙතින් වාර්ෂික සැසඳුම් ප්‍රකාශන ගෙන්වා ගැනීම.	✓		
වාර්ෂික සැසඳුම් වාර්තා භාණ්ඩාගාර පොත් සමඟ සංසන්දනය කිරීම හා ඒ සම්බන්ධ පසු විපරම් සිදු කිරීම.	✓		
ණය ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී උපදෙස් හා තාක්ෂණික සහාය ලබා දීම.	✓		
සියලු ම වියදම් ශීර්ෂ වලින් පොදු තැන්පත් ගිණුම් සැසඳුම් ප්‍රකාශ හා කාල විශ්ලේෂණ වාර්තා ගෙන්වා ගැනීම.	✓		
පොදු තැන්පත් ගිණුමවල ශේෂ භාණ්ඩාගාර පොත් සමඟ සංසන්දනය කිරීම හා පසුවිපරම් කිරීම.	✓		
ආයතනවල ඉල්ලීම අනුව නව පොදු තැන්පත් ගිණුම් විවෘත කිරීම.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
අදාළ ආයතනවල ඉල්ලීම පරිදි පැරණි තැන්පත් ගිණුම් අක්‍රිය කිරීම.	✓		
මූල්‍ය තොරතුරු විශ්ලේෂණ අංශය			
ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම කඩිනම් කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණය කිරීම.	✓		
තක්සේරු කරන ලද මධ්‍යම රජයේ ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීමට සහාය වීම.	✓		
රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන ආකෘතියට අනුව 2024 වර්ෂයේ අයවැයගත මධ්‍යම රජයේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීම.	✓		
රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන ආකෘතියට අනුව 2024 වර්ෂයේ පළාත් සභාවල රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීම.	✓		
රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන ආකෘතියට අනුව උපායමාර්ගික ආයතන (Extra budgetary units) ලෙස හඳුනා ගත් රජයට අයත් ව්‍යාපාර ආයතනවල රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සකස් කිරීම (තෝරාගත් ආයතන 58ක නියැදිය).	✓		
පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට සහභාගී වීම, සහාය වීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම.	✓		
පළාත් සභා වෙතින් මාසිකව රැස්කළ මූල්‍ය තොරතුරු ඒකාබද්ධ කර වාර්ෂිකව වාර්තාවක් සකස් කිරීම.	✓		
මූල්‍ය අංශය			
මු.රෙ 135 අනුව බලතල පැවරීමේ ලේඛනය සකස් කිරීම.	✓		
දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම - 2024.	✓		
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශනය සකස් කිරීම - 2024.	✓		
පොදු තැන්පත් ගිණුමේ ශේෂ සැසඳුම් ප්‍රකාශය හා කාල විශ්ලේෂණ වාර්තාව සකස් කිරීම - 2024.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම - 2024.	✓		
අයවැය චක්‍රලේඛ ප්‍රකාරව 2026 වර්ෂය සඳහා වාර්ෂික අය වැය ඇස්තමේන්තු සැකසීම.	✓		
රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව 2026 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සැකසීම.	✓		
ලෙජර් ගිණුම් පවත්වාගෙන යාම සහ CIGAS හා ITMIS පද්ධති හරහා දෛනික ගනුදෙනු වාර්තා කිරීම.	✓		
දෙපාර්තමේන්තු පොත් සමඟ භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සැසඳීම.	✓		
මාසික වැටුප් ගෙවීම.	✓		
මාසික ගිණුම් සාරාංශ සකස්කර ඉදිරිපත් කිරීම.	✓		
මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනය සැකසීම.	✓		
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම.	✓		
රාජ්‍ය ගිණුම් හා භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ගිණුම් පියවීම - 2025.	✓		
අනුමත අයවැය ප්‍රතිපාදන පාදක කර ගෙන වාර්ෂික අග්‍රිම සීමාව - 2026 සකස් කිරීම.	✓		
පාලන අංශය			
නියමිත දිනට වැටුප් වර්ධක අනුමත කිරීම	✓		
අවශ්‍යතාවය පරිදි වැටුප් පරිවර්තන සකස් කිරීම සහ අනුමත කිරීම.	✓		
කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් විභාගවලට අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීම.	✓		
කාර්ය මණ්ඩල තොරතුරු PACIS හා E-Payroll පද්ධති වෙත යාවත්කාලීන කිරීම සහ අදාළ ආයතන වෙත වාර්තා කිරීම.	✓		
අභ්‍යන්තර සහ බාහිර ස්ථාන මාරු සඳහා අයදුම්පත් යොමු කිරීම.	✓		
ස්ථාන මාරු මත පැමිණෙන නිලධාරීන් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නියෝග පරිදි අදාළ අංශ වෙත අනුයුක්ත කිරීම.	✓		

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
ධාරිතා සංවර්ධන වැඩසටහන් හා දැනුම බෙදා ගැනීමේ වැඩසටහන් සංවිධානය කිරීම.	✓		
නිවාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	✓		
නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම.	✓		
දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ඉල්ලීම් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.	✓		
ණය, අත්තිකාරම්, අතිකාල සහ අනෙකුත් බිල්පත් ගෙවීම් සඳහා යොමු කිරීම.	✓		
දෙපාර්තමේන්තුවේ තැපැල සම්බන්ධව කටයුතු කිරීම.	✓		
වාහන නියමිත දිනයන්ට සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතුවලට යොමු කිරීම.	✓		
රක්ෂණාවරණ සහ ආදායම් බලපත්‍ර යාවත්කාලීන කිරීම.	✓		
ඉන්ධන පරීක්ෂාවන් කිරීම.	✓		
කාර්ය සාධන වාර්තාව සැකසීම - 2025.	✓		
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම - 2026	✓		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය /අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0% - 49%	50% - 74%	75% - 100%
ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය.	• දත්ත අධීක්ෂණය හා වගකීම • ප්‍රතිපත්ති සහ ආයතනික සංගතභාවය	• ක්‍රියාත්මක කරන වැඩ සටහන් ක්‍රියාත්මකවන ආයතන සංඛ්‍යාව • වැඩසටහන්වල සාර්ථකභාවය • රාජ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ නිවැරදිතාවය			✓

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අප දෙපාර්තමේන්තුව යටතේ ඇති ITMIS, New CIGAS, GPS හා වෙනත් දත්ත පදනම් වූ දත්ත පද්ධති නිසි අයුරින් ක්‍රියාත්මක වීම හා අධීක්ෂණය හේතුවෙන් නිකුත් කිරීමට නියමිත මාසික වාර්තා, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා, විවිධ ගෙවීම් පිළිබඳ වාර්තා ආදිය ද නියමිත දිනයන්හි දී ලබා ගැනීමට හැකිවීම. මෙම තිරසර සංවර්ධන ඉලක්කවලට 100% ක්ම අනුගතවීමක් ලෙස සඳහන් කළ හැක.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	28	17	11
තෘතීයික	04	03	01
ද්විතීයික	90	66	24
ප්‍රාථමික	13	08	05

ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 135 ක් වන අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 94ක් විය. මෙම පුරප්පාඩු වූ තනතුරු පහත පරිදි වේ;

අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය විශේෂ ශ්‍රේණිය	01
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා සැලසුම් සේවය විශේෂ ශ්‍රේණිය	01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	06
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා පරිපාලන සේවය	01
නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා තොරතුරු හා සන්.තාක්ෂණ සේවය	02
තොරතුරු හා සන්. තාක්‍ෂණ නිලධාරී	01
සංවර්ධන නිලධාරී	10
කළමනාකරණ සේවා නිලධාරී	14
කාර්යාල කාර්ය සහයක	03
රියදුරු සේවය	02

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

ඉහතින් දක්වා ඇති කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වූ තනතුරු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සඳහා බලපෑම් ඇතිකරන ලදී.

විශේෂයෙන් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන්ගේ හා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරීන්ගේ තනතුරුවල පුරප්පාඩු හේතුවෙන්, New CIGAS පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල, වැටුප් මෘදුකාංගයට අදාළ ක්‍රියාකාරකම්වල, ITMIS පද්ධතියට හා මූල්‍ය වාර්තාකරණ අංශයේ කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීම ප්‍රමාදවීම, පද්ධති දියුණු කිරීමේ ප්‍රමාදයන් ඇතිවීම, පද්ධති

භාවිතකරන්නන්ගේ විමසුම් සඳහා පැහැදිලිකිරීම් ලබාදීම ප්‍රමාදවීම ආදී කරුණු මඟින් බලපෑම් එල්ලවන ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

2025 වසරට පුහුණු වැඩසටහන් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය අනුව දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා යොමු කරවන ලදී.

දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්

අනු අංකය	පුහුණු වැඩසටහන	දිනය	පුහුණු කාලය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව	2025.02.15	පැය 07	67
02	රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව	2025.03.08	පැය 07	69
03	Cyber Security & Google Applications පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව	2025.05.17	පැය 07	61
04	Usage of AI Tools for Public Sector 7 Awareness of Risk Assessment පිළිබඳ පුහුණු වැඩසටහන	2025.06.14	පැය 07	59
05	Public Sector Digital Literacy Session - Online Tools & Platforms සහ ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන්ගේ දායකත්වය පිළිබඳ පුහුණු වැඩසටහන	2025.07.05	පැය 07	55
06	Public Sector Digital Literacy Session - Online Tools & Platforms (දෙවන අදියර) සහ ආතතිය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	2025.08.02	පැය 07	56
07	Introduction to Accrual Accounting and SLIPSAS to the Public Sector of Sri Lanka පිළිබඳ පුහුණු වැඩසටහන	2025.08.23	පැය 07	63
08	Cyber Security Policy පිළිබඳ පුහුණු වැඩසටහන	2025.09.27	පැය 07	65
09	කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	2025.12.13	පැය 07	59
10	කාර්යාල කළමනාකරණය හා ලිපිගොනුකරණය (දෙවන අදියර) පිළිබඳ පුහුණු වැඩසටහන	2025.12.20	පැය 07	55

බාහිර ආයතන විසින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්

	පුහුණු වැඩසටහන	දිනය	පැවැත්වූ ආයතනය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණු වැඩමුළුව	2025.02.20	ඉදිකිරීම් යන්ත්‍රොපකරණ පුහුණු මධ්‍යස්ථානය	1
02	විද්‍යාත්මක, පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම පිළිබඳ පුහුණු වැඩමුළුව	2025.05.29	ඉදිකිරීම් යන්ත්‍රොපකරණ පුහුණු මධ්‍යස්ථානය	1

විදේශයන්හි පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්

අනු අංකය	පුහුණු වැඩසටහන	පුහුණු වැඩසටහන පවත්වන ලද රට	පුහුණු කාලය	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව
01	2025 FreeBalance International Steering Committee (FISC)	ටිමෝර් - ලෙස්ටේ	2025.04.07 වන දින සිට 2025.04.10 වන දින දක්වා	2
02	Seminar on Investment & Financing Management of Railway Infrastructure Construction for Developing Countries	චීනය	2025.07.09 වන දින සිට 2025.07.22 වන දින දක්වා	1
03	Seminar on Cloud based Government Bid Data Management and Application	චීනය	2025.07.22 වන දින සිට 2025.08.04 වන දින දක්වා	1
04	Seminar on Blue Economy Think Tank Network Indian Ocean Rim	චීනය	2025.09.05 වන දින සිට 2025.09.25 වන දින දක්වා	1
05	Forum of Digital Horizons: Transforming Public Financial Management	ජපානය	2025.11.06 වන දින සිට 2025.11.07 වන දක්වා	1
06	Seminar for Senior Government Officials of Sri Lanka	චීනය	2025.11.26 වන දින සිට 2025.12.09 දින දක්වා	1

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ “බී” අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.6	වෙනත්	-		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියලු ම මාසික ගිණුම් සාරාංශ (New CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
3. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)				
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක් ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමතවන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට, සියලු ම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ. (මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මෙය සිදු කරනු ලබයි.)		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම.	අනුකූල වේ. (මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් මෙය සිදු කරනු ලබයි.)		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකර තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
	9. වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.		
10. බැංකු ගිණුම් කළමනාකරණය				
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11. ප්‍රතිපාදන උපයෝජනය				
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම				
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
13. පොදු තැන්පත් ගිණුම				
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
14. අග්‍රිම ගිණුම				
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, මහා භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.		
15. ආදායම් ගිණුම				
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුව ම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
16. මානව සම්පත් කළමනාකරණය				
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලු ම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලු ම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
17. මහජනයා වෙත තොරතුරු ලබා දීම				
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කර තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම				
18.1	අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම				
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කර තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා ම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අදාළ නොවේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම.	අනුකූල වේ.		
20. විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම				
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර තිබීම.	අනුකූල වේ.		